SEDR
Supporting Effective Dispute Resolution
ඵලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම
பயனுறுதிமிக்கவகையில் பிணக்கை தீர்ப்பதற்கு ஆதரவளித்தல்

# Supporting Effective Dispute Resolution

# Your document title

<u>ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය:</u>

*"සාධාරණ විකල්පයක් ශක්තිමත් කිරීම - SEDR වෙතින් පාඩම් සහ ගැඹුරු දැනුම"*

## 1. සැසිවාරයේ මාතෘකාව

තේමාත්මක සැසිවාර අංක 3

යුක්තිය සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම: විශේෂිත සමථ මණ්ඩල වැදගත් වන්නේ ඇයි?

## 2. දිනය, වේලාව සහ ස්ථානය

2025 අප්‍රේල් 29 අඟහරුවාදා
13:30 – 14:30
ස්ථානය: ඕක් කාමරය

## 3. සංකල්පයේ සාරාංශය / හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රජා සමථ මණ්ඩලවල සටහන්වී ඇති සියලුම නඩු වලින් අඩකට ආසන්න ප්‍රමාණයක් මූල්‍ය ආරවුල් හේතුවෙන් ඇතිවුන ඒවාය. එමඟින් එම ප්‍රජා සමථ මණ්ඩලවල ධාරිතාවය අඩු වන අතර අනෙකුත් ආරවුල් කෙරෙහි ඇති අවධානය වෙනතකට යොමු වනු ඇත. රුපියල් මිලියනයකට අඩු ආරවුල් අනිවාර්යයෙන් මෙම සමථ මණ්ඩලවලවලට යොමු කිරීම මෙම තත්ත්වයට ප්‍රධාන සාධකයක් වනු ඇත.

Part of the programme STRIDE
Funded by the European Union
Implemented by BRITISH COUNCIL The Asia Foundation

එමඟින් බොහෝ විට මූල්‍ය අර්බුදයට වඩා ණය ප්‍රතිව්‍යුහගත කිරීම කෙරෙහි අවධානය යොමු කරන නඩු අධික වීමට හේතු වී තිබේ.

බොහෝ සමථකාරවරුන් මෙම ආරවුල් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය මූල්‍ය විශේෂඥතාව නොමැතිව සිටිනු ඇත. (මූල්‍ය ආරවුල් පිළිබඳ) විශේෂ සමථ මණ්ඩල මඟින් සමථකාරවරුන්ට ඉලක්කගත පුහුණුවක් ලබා දීම මඟින් මෙම හිඩැස පියවා ගත හැකිය. මූල්‍ය ආයතන බොහෝ විට තීරණ ගැනීමේ බලයක් නොමැති නියෝජිතයන් මෙම කාර්යය සඳහා යවන බැවින්, බල අසමබරතාවයන් සමථ කිරීමේ කටයුතු තවදුරටත් සංකීර්ණ කරන තත්ත්වයක් පවතී. විශේෂිත මණ්ඩලයකට බලයලත් තීරණ ගන්නන්ගේ සහභාගීත්වය බලාත්මක කළ හැකි අතර, එමඟින් සාධාරණත්වය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කළ හැකිය.

සමථ මණ්ඩලවලට ඉදිරිපත් කරනු ලබන සංකීර්ණම නඩු අතර ඉඩම් ආරවුල්, දේපළ නීතිය, ඓතිහාසික හිමිකම් සහ නියාමන රාමු පිළිබඳ තීරණ ගැනීමට විශේෂඥතාව අවශ්‍යව තිබේ - බොහෝ සමථකාරවරුන් මෙම දැනුම නොමැතිව සිටිනු ඇත. විශේෂ සමථ මණ්ඩල (ඉඩම්) මඟින් විසඳුම් ප්‍රතිඵල ඉහළ නැංවීමට අවශ්‍ය විශේෂීකරණය ලබා දීමට හැකි වනු ඇත.

ප්‍රජා සමථ මණ්ඩලවලට හිමි බලය සීමිතව තිබෙන බැවින් රජය සතු ඉඩම් ආරවුල් සමඟ ද පොරබැදීමට සිදුවී ඇත. දැනට පවතින ඉඩම් පිළිබඳ සමථ මණ්ඩලවල සාර්ථකත්වය පුළුල් කිරීම මඟින්, කැපවීමකින් වැඩ කරන මණ්ඩලයකට මෙම හිඩැස් පියවා ගැනීමට හැකි වනු ඇත. මේ අතරතුර, ඉඩම් ආරවුල්වලට මුහුණ දෙන ප්‍රජාවන්ට සාධාරණ ප්‍රතිඵල සහතික කරමින්, ජංගම සමථ ඒකක සහ විශේෂඥ උපදේශක කමිටු මඟින් ප්‍රවේශ්‍යතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කළ හැකි වනු ඇත.

මෙම සැසිවාරය තුළ ඉඩම් සහ මූල්‍ය ආරවුල් විසඳීම සඳහා කැප වූ විශේෂ සමථ මණ්ඩලවල අවශ්‍යතාවය ගැන අවධාරණය කරන අතර එම ඉඩම් සහ මූල්‍ය ආරවුල් විසඳීමේදී අනුගමනය කරන විශේෂිත ප්‍රවේශයක ඇති වාසි ද ඉස්මතු කිරීම අරමුණක් වනු ඇත.

## 4. <u>සැසිවාරයේ පරමාර්ථ</u>

- ඉඩම්/දේපල සහ මූල්‍ය ආරවුල් විසඳීම සඳහා විශේෂ සමථ මණ්ඩලවල වැදගත්කම ගැන ඉස්මතු කිරීම.
- සමථ මණ්ඩල කොමිසම් සභාවේ සහාය ඇතිව ඒ සම්බන්ධයෙන් විශේෂ සමථ මණ්ඩල පිහිටුවීම සඳහා ඵලදායී උපාය මාර්ග ගවේෂණය කිරීම.
- SEDR යටතේ ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ කිහිපයක් ප්‍රදර්ශනය කිරීම (උදා: පරිශීලක තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණය, CEPA ඉඩම් සහ මූල්‍ය ආරවුල් කඩිනම් තක්සේරු කිරීම)

## 5. <u>මධ්‍යස්ථකරු / පහසුකම් සපයන්නා</u>

- මධ්‍යස්ථකරු: චන්දුල කුඹුකගේ මහත්මිය, වැඩසටහන් කළමනාකාරිනී, ආසියා පදනම

## 6. <u>කථිකයන් / විශේෂඥ කණ්ඩායමේ සාමාජිකයන්</u>

- ඉදිරිපත් කරන්නිය: සුභෂණ විජයරත්න මෙනවිය, වැඩසටහන් නිලධාරිනී, ආසියා පදනම
- විශේෂඥ කණ්ඩායමේ සාමාජිකාව: ධාරා විජයතිලක මෙනවිය, නීතිඥ සහ අධ්‍යක්ෂකවරිය, IADR මධ්‍යස්ථානය
- විශේෂඥ කණ්ඩායමේ සාමාජිකාව: තිළිණි රත්නසූරිය මෙනවිය, ලේකම්, සමථ මණ්ඩල කොමිෂන් සභාව